# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1639/25 - 2010 පෙබරවාරි 03 වැනි බදාදා - 2010.02.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(1) වගන්තිය යටතේ හික්කඩුව නගර සභාවේ උප සභාපති ධූරයේ පුරප්පාඩුව පිරවීම**

උප සභාපති, සභාපති ධූරයට පත්වීම හේතුකොට ගෙන හික්කඩුව නගර සභාවේ උප සභාපති ධූරය පුරප්පාඩු වී ඇති හෙයින් ද,

ඉහත කී ආඥාපනතේ 65අ(1) වගන්තිය යටතේ, උප සභාපති වන වඩුගේ ප්‍රියන්ත නම් වූ උප සභාපති අයත් වන්නා වූ එක්සත් ජනතා නිදහස් සන්ධානය නම් වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් ට, දින තිහක (30) කාල පරිච්ඡේදය ඇතුළත උප සභාපති වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතු යයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, ඒ පක්ෂයට අයත් වන්නා වූ ද, ඒ හික්කඩුව නගර සභාවේ සභිකයා පිළිබඳ තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා මිනල් සෙම්බකුට්ටි මහතා නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

හික්කඩුව නගර සභාවේ තේරීම්භාර නිලධාරි අන්තෝනි බිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා වන මම, ( 262 වැනි අධිකාරය වූ ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(1) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, මිනල් සෙම්බකුට්ටි මහතා හික්කඩුව නගර සභාවේ උප සභාපති වශයෙන් තෝරා පත් කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

ඒ. බී. අයි. ද සිල්වා,<br>
තේරීම්භාර නිලධාරි,<br>
හික්කඩුව නගර සභාව.

2010 ජනවාරි මස 18 වැනි දින,<br>
ගාල්ල,<br>
මැතිවරණ කාර්යාලයේ දී ය.

02-412

1A - G 012399— 360 (2010/02)

**(262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වගන්තිය යටතේ හලාවත නගර සභාවේ සභිකයෙකුගේ ධූරයේ පුරප්පාඩුවක් පිරවීම**

අවසර නොලබා අනුගාමී රැස්වීම් තුනකට වැඩි සංඛ්‍යාවකට නොපැමිණ සිටීමේ හේතුවෙන් හලාවත නගර සභාවේ සභිකයෙකුගේ ධූරය පුරප්පාඩු වී ඇති හෙයින් ද,

ඇන්ටනී රුද්‍රිගු නම් වූ සභිකයා අයත් වන එක්සත් ජනතා නිදහස් සන්ධානය නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් ට, දින තිහක (30) කාල පරිච්ඡේදයක් ඇතුළත සභිකයකු වශයෙන් තෝරා පත්කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත්කරනු ලැබිය යුතු වූ, ඒ පක්ෂයට අයත් ඒ හලාවත නගර සභාවේ සභිකයකු වශයෙන් තේරී පත්වීම සඳහා ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු නාම යෝජනා කිරීමට, ඉහත කී ආඥාපනතේ 65අ(2) වන වගන්තිය යටතේ මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ඉහත කී ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු වන ලක්ෂ්මන් ප්‍රනාන්දු මහතා ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් නම් කරනු ලැබ ඇති හෙයින් ද;

හලාවත නගර සභාවේ තේරීම්භාර නිලධාරි අබ්දුල් ඔෆූර් මොහොමඩ් නෆීල් වන මම, ( 262 වැනි අධිකාරය වූ ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වන වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, ලක්ෂ්මන් ප්‍රනාන්දු මහතා හලාවත නගර සභාවේ සභිකයෙකු වශයෙන් තෝරා පත් කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

ඒ. ඕ. එම්. නෆීල්,
තේරීම්භාර නිලධාරි,
හලාවත නගර සභාව.

2010 ජනවාරි මස 21 වැනි දින,
පුත්තලම,
මැතිවරණ කාර්යාලයේ දී ය.

02-413

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.